# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) - 2016

## අධ්‍යාපන මූලධර්ම හා ගැටළු

**පැය තුනයි (03)**

'අ' කොටසින් පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ද 'ආ' කොටසින් හයවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ද වශයෙන් ප්‍රශ්න හයකට (6) පිළිතුරු සපයන්න.

---

- එක් එක් කොටසට අදාළ පිළිතුරු වෙන වෙනම පොත්වල ලියා වෙන වෙනම අමුණා බාර දෙන්න.
- ඒ ඒ පිළිතුරු පොත්වල මුල් පිටුවේ දකුණු කෙළවරේ කුමන කොටසද යන්න විෂය නාම සමඟ සඳහන් කරන්න.
- 01 සහ 06 වන ප්‍රශ්නවලට ලකුණු 20 බැගින් ද අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද වෙන්කර ඇත.

### අ කොටස - දාර්ශනික මූලධර්ම

1. i. අරමුණු සහ පරමාර්ථ යනු කුමක්ද? යන්න අර්ථ දක්වා ඒවායේ ලක්ෂණ දෙක බැගින් ලියන්න.

ii. "අධ්‍යාපනය දාර්ශනය මත යැපේ." මෙය සනාථ කිරීම සඳහා යෝග්‍ය හේතූන් දෙකක් ලියන්න.

iii. දැනුම් සමාජයක (Knowledge Society) දැකිය හැකි ලක්ෂණ හතරක් ලැයිස්තු ගත කරන්න.

iv. දිවි පැවැත්ම සඳහා ඉගෙනුම (Learning to be) යන්නේන අදහස් කරන්නේ කුමක්ද?

v. චරිතායන අධ්‍යාපනය ලබාදීමෙන් පාසලකට ලබාගත හැකි සුබවාදී ප්‍රතිඵල හතරක් ලියන්න. (ලකුණු 5 x 4 = 20)

2. i. අධ්‍යාපන දර්ශනය යන්න කෙටියෙන් හඳුන්වා එහි කාර්යයන් සහ ඒ තුළින් ගුරුවරයෙකුට ඇති ප්‍රයෝජන සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. "කිසියම් රටක අධ්‍යාපනයක් යම් පිළිගත් දාර්ශනික මතවාදයක් මත ගොඩනැංගිය යුතුය" මෙම කියමනෙහි 'සත්‍ය' හෝ 'අසත්‍යතාව' තාර්කිකව සාකච්ඡා කරන්න.

(ලකුණු 8)

3. i. අධ්‍යාපනයේ ස්වභාවධර්මවාදය (Naturalism in Education) සහ විඥානවාදය (Idealism in Education) යන දාර්ශනික චින්තනයන්ගේ අදහස් පහත තේමාවන් ඔස්සේ තුලනාත්මකව අධ්‍යයනය කරන්න.

1. දාර්ශනික මූලධර්ම
2. අධ්‍යාපන මූලධර්ම
3. විෂයමාලාව
4. අධ්‍යාපන සාරධර්ම
5. ගුරු භූමිකාව

(ලකුණු 7)

ii. උපයෝගිතාවාදී දාර්ශනික චින්තනයේ (Pragmatism in Education) මූලික දාර්ශනික අදහස් පැහැදිලි කොට, ඒවා ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් කෙරෙහි ඇති කරන ඇති බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 8)

4. i. ඉගැන්වීම (Teaching) පිළිබඳ සම්ප්‍රදායික මතය (Traditional Paradigm) සහ නූතන මතය (New Paradigm) තුලනාත්මකව අධ්‍යයනය කරන්න.

(ලකුණු 7)

ii. අනාගත අධ්‍යාපනය තුළ ගුරුවරයාගේ භූමිකාව කෙසේ විය යුතු දැයි සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

5. i. මහත්මා ගාන්ධිතුමාගේ අධ්‍යාපන චින්තනය පැහැදිලි කරන්න.

(ලකුණු 7)

ii. විසි එක් වැනි සියවසට මහත්මා ගාන්ධිතුමාගේ චින්තනය අදාළ වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 8)

## ආ කොටස - අධ්‍යාපන සමාජවිද්‍යා මූලධර්ම

6. i. සමාජ ස්තරායනය හා සම්බන්ධ සම අධ්‍යාපන අවස්ථා සංකල්පයේ උපඅවස්ථා <u>හතර</u> නම් කරන්න.

ii. වර්තමානයේ විවිධ සමාජවල සමාජ සචලනය සිදුවන ප්‍රධාන මාර්ග <u>දෙක</u> හඳුන්වන්න.

iii. අවිධිමත් සමූහ පාසලේ ක්‍රියාවලියට හිතකරවන බලපෑන ආකාරය හඳුන්වන්න.

iv. සමාජ වෙනස්වීම් පිළිබඳ විවිධ චින්තකයින් ඉදිරිපත් කර ඇති මතවාද <u>දෙකක්</u> දක්වන්න.

v. පාසලක් තුළ ශිෂ්‍ය සමාජානුයෝජනය සඳහා පවතින කාරක <u>හතරක්</u> නම් කරන්න.

(ලකුණු 5 x 4 = 20)

7. i. සංස්කෘතිය සමග විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය සම්බන්ධවන අවධානය විස්තර කරන්න. (ලකුණු 7)

ii. වර්තමාන සමාජයේ අවශ්‍යතාවලට අනුව පාසලින් සංස්කෘතිය පවරාදීමේදී ගුරුවරයාගේ ක්‍රියාකලාපය කෙබඳු විය යුතු දැයි පෙන්වා දෙන්න.

(ලකුණු 8)

8. i. සමාජ ස්තරායන සංකල්පය හඳුන්වා අධ්‍යාපනයට සම්බන්ධවන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 7)

ii. වර්තමාන සමාජයේ පොදු සමාජ සචලනයට බලපාන හේතු හඳුන්වා අධ්‍යාපනයෙන් සමාජ සංචලනය සිදුවන අන්දම විස්තර කරන්න.

(ලකුණු 8)

9. i. පවුලේ බලපෑමෙන් දරුවෙක් සමාජානුයෝජනය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. සමාජානුයෝගී කාරකයක් වශයෙන් සමයස් කණ්ඩායම් ශිෂ්‍ය ජීවිතයට විවිධ අන්දමින් බලපාන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 8)

10. i. ගුරු භූමිකාවක ස්වභාවය තීරණය වන සමාජීය සාධක විස්තර කරන්න.

(ලකුණු 7)

ii. වර්තමානයේ ගුරු භූමිකාවට අයත් ක්ෂෙත්‍ර පර්යේෂණ අනාවරණ හා නිර්දේශ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

○∘○∘○∘○∘○∘○∘○∘○∘